සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Southern Province Department of Education Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

32	S	I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

ව්‍යාපාර අධ්‍යයනය - I
Business Studies - I

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.**
- **41 -50 දක්වා ප්‍රශ්නනවලට නිශ්චිත පිළිතුර සපයන්න.**

(01) පහත දැක්වෙන්නේ, අවශ්‍යතා හා වුවමනාවලට ආවේණික ලක්ෂණ වේ.

A - අසීමිත වීම B - පොදුවීම C - විවිධ වීම
D - සමාජ බලවේග මගින් වෙනස්කළ නොහැකි වීම. E - සීමිත වීම
F - ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකිවීම.

ඉහත ලක්ෂණ අතුරින් වුවමනාවලට පමණක් ආවේණික ලක්ෂණ වනුයේ,

1. ACD 2. ACF 3. BDE 4. ADE 5. ADF (..........)

(02) ව්‍යාපාරයක ගති ලක්ෂණයක් නොවන්නේ මින් කුමන පිළිතුර ද?

1. වුවමනා නිර්මාණය කිරීම
2. ලාභයෙන් අභිප්‍රේරණය කිරීම
3. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදුවීම
4. විකුණුම් උපරිම කිරීම
5. අවදානමක් තිබීම (..........)

(03) ව්‍යාපාරයක කාර්යයන් අතුරින් පර්යේෂණය හා සංවර්ධනයට අදාළවන කටයුත්තක් වන්නේ,

1. නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය හා නව නිපැයුම් සොයාගැනීම
2. සේවක ලිපිගොනු සැකසීම
3. අවශ්‍ය මුදල් සපයාගැනීම හා යෙදවීම
4. සේවකයන් පුහුණු කිරීම හා උසස් කිරීම
5. ප්‍රචාරණය හා බෙදාහැරීම (..........)

(04) ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයට අයත්වන ප්‍රතිලාභ ඇතුළත් නිවැරදි කාණ්ඩය තෝරන්න

1. හරිත නිෂ්පාදිත, කීර්තිනාමය වර්ධනය, සමානාත්මතාව සාධාරණ වීම
2. කීර්තිනාමය වර්ධනය, පැවැත්ම තහවුරු වීම, අරමුණු හා පරමාර්ථ ලඟාකර ගැනීම
3. වෘත්තීමය ආරක්ෂාව, සාධාරණ ඉපයීම, හරිත නිෂ්පාදන
4. අඛණ්ඩ පැවැත්ම, අයිතිවාසිකම් සුරක්ෂිතවීම, සාධාරණ වීම
5. ආර්ථික ප්‍රතිලාභ ලැබීම, ප්‍රජා සත්කාර සේවා, සාධාරණ බව (..........)

(05) රජය ව්‍යාපාරික කටයුතු වලට බලපෑම් කිරීමට ප්‍රධාන හේතුවක් වන්නේ,

1. සමතුලිත අයවැයක් පවත්වාගෙන යාම සඳහා
2. රාජ්‍ය අංශයේ ව්‍යාපාර ආරක්ෂා කරගැනීම සඳහා
3. රජයට ආදායම් ලබාගැනීම සඳහා
4. මහජන සුභසිද්ධිය සඳහා
5. දළ ජාතික නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා (..........)

(06) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ ඇතුළත් නොවන කරුණ වන්නේ,

1. ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසිම හවුල්කරුවකුට හිමි නොවේ.
2. තම සේවය වෙනුවෙන් වේතනයක් හවුල් ව්‍යාපාරයෙන් ලැබිය නොහැකිය.
3. ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පෞද්ගලිකව දැරූ වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතු නොවේ.
4. ගිවිසගත් ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% වාර්ෂික පොළියක් හිමිවේ.
5. ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගීවීමට සෑම හවුල්කරුවකුටම අයිතිය ඇත. (..........)

(07) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් හා ඊට අදාළ ලක්ෂණයන් ය.

ව්‍යාපාර සංවිධාන වර්ගය	ලක්ෂණ
A - හවුල් ව්‍යාපාර	1. කොටස් හෝ සුරුකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැක.
B - සී/ස පෞද්ගලික සමාගම්	2. අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එකකි.
C - සී/ස පොදු සමාගම්	3. අමාත්‍යංශයක් යටතේ සෘජු පාලනයට යටත් වේ.
D - රාජ්‍ය දෙපාර්තමේන්තු	4. අන්‍යොන්‍ය සම්බන්ධතා පැවතීම

ඉහත ව්‍යාපාර සංවිධානවලට අදාළ ලක්ෂණ නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

1. A - 2 / B - 3 / C - 4 / D - 1
2. A - 4 / B - 2 / C - 3 / D - 1
3. A - 1 / B - 2 / C - 4 / D - 3
4. A - 4 / B - 2 / C - 1 / D - 3
5. A - 3 / B - 2 / C - 1 / D - 4 (..........)

(08) පහත වගුවේ දැක්වෙන්නේ සංයෝජන සිදුවන ප්‍රධාන ආකාර තුනක් හා ඒවාට නිදසුන් වේ.

සංයෝජන ආකාර	නිදසුන්
A - තිරස් සංයෝජන	1. සපත්තු නිෂ්පාදන සමාගමක් සබන් නිෂ්පාදන සමාගමක් සමඟ සංයෝජනය වීම
B - සිරස් සංයෝජන	2. සපත්තු නිෂ්පාදනය කරන සමාගමක් හම් නිෂ්පාදන හා සපත්තු අලෙවි කරන සමාගමක් සමග සංයෝජනය වීම
C - විෂම සංයෝජන	3. සපත්තු නිෂ්පාදන ආයතන දෙකක් සංයෝජනය වීම.

සංයෝජන ප්‍රධාන ආකාර හා නිදසුන් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

1. A - 2 / B - 1 / C - 3
2. A - 3 / B - 2 / C - 1
3. A - 1 / B - 2 / C - 3
4. A - 3 / B - 1 / C - 2
5. A - 2 / B - 3 / C - 1 (..........)

(09) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ආකාර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. ස්වයං ඇගයීම / පුහුණුව / අධ්‍යාපනය / අත්දැකීම්වලින්
2. පළපුරුද්ද / කැපවීම / පවුල් පසුබිම / වයස
3. කැපවීම / අධ්‍යාපන මට්ටම / දෙමාපිය ආභාෂය / ආදර්ශ චරිත
4. පුහුණුව / අත්දැකීම් / තරඟකාරීත්වය / ආර්ථික ප්‍රතිපත්ති
5. නීතිමය පසුබිම / ආර්ථික ප්‍රතිපත්ති / පවුල් පසුබිම / අත්දැකීම් (..........)

(10) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා විශිෂ්ඨතා සම්මාන ලබාදීම සිදුකරන ආයතනය වන්නේ,

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
2. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය
3. ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය
4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය
5. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (..........)

(11) නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක ලක්ෂණයක් වන්නේ මේ අතරින් කුමක් ද?

1. ලේඛන මත මුද්‍රිත සුරැකුම්පත් වශයෙන් නිකුත් කිරීම
2. රජයේ පිරිවැය අඩිඩවීම
3. විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත පැවරීමේදී කල්ගතවීම
4. ආයෝජකයන්ගේ අතපසුවීම් වල ඉඩ ප්‍රස්ථා තිබීම
5. මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් සියළුම තොරතුරු සුරක්ෂිතව රැස්කර තිබීම (..........)

(12) මුදලේ ක්‍රය ශක්තිය යන්න වඩාත් හොඳින් ප්‍රකාශ වන වගන්තිය වන්නේ,

1. මුදල් ඒකකයක් වියදම් කිරීමට ඇති හැකියාවය.
2. ආර්ථිකයක මුදල් සංසරණය වන ප්‍රවේගයයි.
3. මුදල් ඒකකයක් සඳහා ඇති නෛතික පිළිගැනීමයි
4. පාරිභෝගිකයන් මුදල් සඳහා කරන ඉල්ලුමයි.
5. මුදල් ඒකකයකින් ගතහැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණයයි. (..........)

(13) පහත දැක්වෙන්නේ මූල්‍යායතන කිහිපයක් හා ඒවායින් ඉටුකෙරෙන කාර්ය කිහිපයකි.

ආයතන	කාර්යයන්
A - ලියාපදිංචි මූල්‍ය සමාගම්	1. ඉතිරිකිරීමේ තැන්පත් පවත්වාගෙන යාම කාලීන තැන්පතු පවත්වාගෙන යාම, මැදි හා දිගුකාලීන ණය සැපයීම
B - බලපත්‍රලාභී වාණිජ බැංකු	2. ආයෝජන හා කළමණාකරන උපදෙස් සැපයීම, ව්‍යාපෘති වාර්තා සැකසීම, මූල්‍ය අලෙවි උපදේශන සේවා සැපයීම
C - වණික් බැංකු	3. ඉල්ලුම් තැන්පතු පවත්වාගෙන යාම, විදේශ විනිමය කටයුතු වලට යෙදීම, බැංකු අණකර පහසුකම් සැපයීම.
D - බලපත්‍රලාභී විශේෂිත බැංකු	4. කුලීපිට ණය මූල්‍යකරණය කල්බදු මූල්‍යකරණය, ඉඩම් හා දේපළ වෙළඳාම් කටයුතු

ඉහත ආයතන හා කාර්යය නිවැරදිව ගලපන ලද පිළිතුර වන්නේ,

1. A - 2 / B - 4 / C - 3 / D - 1 2. A - 3 / B - 1 / C - 4 / D - 2
3. A - 1 / B - 2 / C - 3 / D - 4 4. A - 4 / B - 3 / C - 2 / D - 1
5. A - 4 / B - 1 / C - 3 / D - 2 (..........)

(14) ප්‍රාරක්ෂණය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
1. අදාල දේපලෙහි සත්‍ය වටිනාකමට වඩා අඩුවෙන් රක්ෂණය කිරීම
2. රක්ෂණ සමාගම තම රක්ෂිතයන්ගේ අනුදැනුම ඇතිව වෙනත් රක්ෂණ සමාගමක රක්ෂණය කිරීම.
3. රක්ෂිතයා සිය අවදානම රක්ෂණ සමාගම් දෙකක හෝ කිහිපයක රක්ෂණය කිරීම.
4. විශාල වටිනාකමක් ඇති අවදානමක් කොටස් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාරදීම.
5. දේපලෙහි සත්‍ය වටිනාකමට වඩා වැඩි වටිනාකමට රක්ෂණය කිරීම. (..........)

(15) සන්නිවේදන මූලිකාංගයක් ලෙස ප්‍රතිපෝෂණයෙහි වැදගත්කම වන්නේ,
1. ලබන්නාට පණිවුඩය නිවැරදිව හා ඉක්මණින් ලබාදීමටයි.
2. පණිවුඩය යැවීමට හේතුව දැනුම් දීමටය.
3. පණිවුඩය ලද බව හා තේරුම්ගත් බව දැනුම්දීමටයි.
4. පණිවුඩය වෙත ලබන්නාගේ අවධානය යොමුකිරීමටයි.
5. කවුරුන් විසින් පණිවුඩය සන්නිවේදනය කරන්නේදැයි දැනුම්දීමටයි. (..........)

(16) යම්කිසි රටක ප්‍රවාහනය ඉතා දියුණු මට්ටමක පැවතීමට නම්,
1. පුළුල් අධිවේගී මාර්ග පද්ධතියක් හා අති සුඛෝපබෝගී වාහන පැවතිය යුතුය.
2. මාර්ග හා මාධ්‍ය මෙන්ම ඉන්ධන ලබාගැනීම ද ලාභදායී යහපත් මට්ටමින් පැවතිය යුතුය.
3. සියළු පහසුකම් වලින් අංග සම්පූර්ණ වූ දුම්රිය ස්ථාන, වරාය, ගුවන් තොටුපළ හා බස් නැවතුම්පළවල් තිබිය යුතුය.
4. හොඳ මාර්ග, සුඛෝපබෝගී වාහන, බලශක්තිය හා නැවතුම්පොළවල් සංවර්ධනය විය යුතුය.
5. සුඛෝපභෝගී දුම්රිය මැදිරි සහිත දුම්රිය හා රටපුරා ව්‍යාප්ත වූ දුම්රිය මාර්ග පද්ධතියක් පැවතිය යුතුය. (..........)

(17) ගබඩාවක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු කරුණක් නොවන්නේ,
1. ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ගොඩනැගිල්ල තුළ චලනය කිරීමේ ඉඩකඩ
2. ද්‍රව්‍ය භාවිතයේ වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන්කිරීමේ අවශ්‍යතාව
3. ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව
4. අසුරන ලද නිෂ්පාදිතවලට හා සේවකයන්ට ආරක්ෂාකාරී වීම
5. ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව (..........)

(18) පහත සඳහන් සංවිධාන අතුරින් වෙළඳ කලාපයක් නොවන්නේ කුමක් ද?
1. ADTA 2. NAFTA 3. IBRD 4. ASEAN 5. EU (..........)

(19) A, B, C, D යන අක්ෂරවලින් අන්තර්ජාතික වෙළඳාමේ භාවිතා වන ලියවිලි කිහිපයක් ද 1, 2, 3, 4 යන අක්ෂර වලින් ඒවායේ වැදගත්කම ද දැක්වේ.

ලියවිලි	වැදගත්කම
A. හානි රක්ෂණ ලිපිය	1. අපනයන භාණ්ඩවල වටිනාකම අපනයනකරුවන්ට ලැබීම තහවුරු වේ.
B. සනීපාරක්ෂක සහතිකය	2. වරණීය තීරුබදු ලබාගැනීමට උපකාරී වේ.
C. ප්‍රභවස්ථාන සහතිකය	3. දෘෂ්‍ය නෞභාර පතක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීමට ඉවහල් වේ.
D. ණයවර ලිපිය	4. ඇතැම් කෘෂි නිෂ්පාදනවල පරිභෝජන යෝග්‍යතාව සහතික කරයි.

ලියවිලි හා වැදගත්කම නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

1. A - 3 / B - 4 / C - 1 / D - 2
2. A - 1 / B - 2 / C - 3 / D - 4
3. A - 4 / B - 2 / C - 3 / D - 1
4. A - 1 / B - 3 / C - 4 / D - 2
5. A - 3 / B - 4 / C - 2 / D - 1 (..........)

(20) සංවිධානකරණ මූලධර්ම කිහිපයක් පහත වගුවේ X තීරුවේ දක්වා ඇති අතර ඊට අදාළ කාර්යය අර්ථ දැක්වීම Y හි දැක්වේ.

X	Y
A. මධ්‍යගතකරණය	1. බලය මත පවරන ලද කාර්යය ඉටු කිරීමට ඇති බැඳීම
B. බලය	2. ඉලක්ක ළඟාකර ගැනීමට පුද්ගලයන්ගේ චර්යාව කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව.
C. වගකීම	3. කාර්යයක් තවත් අයෙකු ලවා කරවා ගැනීමට යම් පුද්ගලයකු සතු හැකියාව
D. නායකත්වය	4. ඉහළ කළමණාකරණ මට්ටම සමීපයේ තීරණ ගැනීමේ බලතල රඳවාගැනීම

X හා Y තීරු ගැලපූ විට දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. A - 2 / B - 4 / C - 1 / D - 3
2. A - 4 / B - 3 / C - 1 / D - 2
3. A - 4 / B - 1 / C - 3 / D - 2
4. A - 2 / B - 3 / C - 1 / D - 4
5. A - 3 / B - 4 / C - 1 / D - 2 (..........)

(21) කළමණාකරණ මූලිකාංගයක් වන සැලසුම්කරණ ක්‍රියාවලියට අදාළ වන පහත දැක්වෙන ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

1. දැක්ම යනු සංවිධානයක ව්‍යාපාරික ප්‍රවර්තකයින්ගේ සිහිනය ලෙස හැඳින්විය හැකිය.
2. මෙහෙවර මඟින් සංවිධානයේ විෂය පථය පිළිබඳව අවබෝධයක් ලබා දේ.
3. සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එහි සාර්ථක අසාර්ථකතාවය මැන බැලීම පාලනයයි.
4. අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කළයුතු වන්නේ, දැක්ම හා මෙහෙවර කරා ළඟාවන පරිදි වේ.
5. අරමුණ සංවිධානයක හෝ ආයතනයක පැවැත්ම සඳහා හේතුව පැහැදිලි කරයි. (..........)

(22) පහත වගුවේ නිෂ්පාදන ක්‍රම 3ක් ද, ඒ හා බැඳුණු ලක්ෂණ ලැයිස්තුවක් ද දැක්වේ.

නිෂ්පාදන ක්‍රම	ලක්ෂණ
A. කාර්ය නිෂ්පාදනය	1. පිරිවැය ඉතා ඉහළය.
	2. නිෂ්පාදන පරිමාව ඉහළය
B. සමූහ නිෂ්පාදනය	3. වෙළඳපොළ මුළු ඉල්ලුම නොසලකයි.
	4. රැකියා විශේෂීකරණයට මුල්තැන හිමිවේ.
C. ප්‍රවාහ නිෂ්පාදනය	5. සම්පත් නාස්තිය මධ්‍යස්ථයි.
	6. පිරිවැය ඉතා පහළයි.

ඉහත තොරතුරු නිවැරදිව ගලපා ඇති කාණ්ඩය වන්නේ,

1. A - 1, 2 / B - 3, 4 / C - 5, 6
2. A - 2, 3 / B - 4, 5 / C - 1, 6
3. A - 1, 4 / B - 2, 6 / C - 3, 5
4. A - 1, 4 / B - 3, 5 / C - 2, 6
5. A - 5, 6 / B - 1, 2 / C - 3, 4

(..........)

(23) පහත දැක්වෙනුයේ සීමිත X4 සමාගමේ නිෂ්පාදිත භාණ්ඩයකට අදාල දත්තයන් ය.

* ඒකක ශ්‍රම පිරිවැය රු. 24.00
* ඒකකයක අමුද්‍රව්‍ය පිරිවැය රු. 32.00
* විචල්‍ය පොදු කාර්ය පිරිවැය රු. 8.00
* ස්ථාවර පොදු කාර්ය පිරිවැය රු. 32,000.00

නිෂ්පාදන ඒකක ප්‍රමාණය 10,000 කි. එම සියලුම නිෂ්පාදිත විකිණී ඇත. ඒකකයකත විකුණුම් මිල රු. 80.00 කි. ඉහත දක්වන ලද නිෂ්පාදිතයේ සමච්ඡේද විකුණුම් වටිනාකම හා ප්‍රමාණය පිළිවෙලින්,

1. රු. 160,000 හා ඒකක 8000
2. රු. 80,000 හා ඒකක 8000
3. රු. 80,000 හා ඒකක 4000
4. රු. 160,000 හා ඒකක 2000
5. රු. 120,000 හා ඒකක 16,000

(..........)

(24) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට භාණ්ඩයකට සේවාවකට ඇති හැකියාව ගුණත්වය ලෙස සැලකේ. භාණ්ඩයක ගුණත්වය පරික්ෂා කිරීම සඳහා භාවිතා කළහැකි ශිල්ප ක්‍රමයක් නොවන්නේ,

1. ගුණත්ව ප්‍රමිති අනුගමනය කිරීම
2. ගුණත්ව පරීක්ෂණ ක්‍රම යොදා ගැනීම
3. වගකීම් සහතික නිකුත් කිරීම
4. තත්ත්ව ආරක්ෂණය
5. තත්ත්ව කව පවත්වාගෙන යාම

(..........)

(25) පහත X තීරුවේ සඳහන් අලෙවිකරණ සංකල්ප හා Y තීරුවේ සඳහන් අවසාන ඉලක්කය නිවැරදිව ගැලපූ විට අදාළ වරණය තෝරන්න.

X තීරුව	Y තීරුව
1. ගණුදෙනුකරු සංකල්පය	A - ගණුදෙනුකරු තෘප්තිමත් කිරීමෙන් ලාභ ඉපයීම
2. නිෂ්පාදිත සංකල්පය	B - ඇල්මැති පාර්ශවයනට හා සමාජයට ප්‍රතිලාභ ලබාදීම තුළින් ව්‍යාපාරයේ ඉලක්ක ඉටුකර ගැනීම
3. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය	C - පිරිවැටුම ඉහළ නැංවීම තුළින් ලාභය උපරිම කිරීම
4. විකුණුම් සංකල්පය	D - ගුණත්වය වර්ධනය තුළින් ලාභ ඉපයීම
5. අලෙවිකරණ සංකල්පය	E - ගණුදෙනුකරුගේ පක්ෂපාතීත්වය ජීවිත කාලය වටිනාකම තුළින් ලාභදායකත්වය ලඟා කරගැනීම.

1. ABBCE
2. EDBCA
3. CADBE
4. AEBCD
5. EBACD

(..........)

(26) වෙළඳපොළට නිෂ්පාදිත සැලසුම්කරන විට අලෙවිකරු එම නිෂ්පාදිතය තුළින් පාරිභෝගිකයාට වටිනාකමක් ලබාදීමට උත්සාහ කරන ලදි මට්ටම් 5කදී මෙම වටිනාකම නිෂ්පාදිතයට එක් කරයි. ඒ අනුව රූපවාහිනියක රූප චලනය වීමට හා ශබ්දය ඇතිවන ආකාරයක සැකසීම මින් කුමන මට්ටමට අයත් වේද?

1. මූලික නිෂ්පාදිත මට්ටම
2. වැඩි දියුණු කළ නිෂ්පාදිතය
3. හර ප්‍රතිලාභ මට්ටම
4. විභාව නිෂ්පාදිතය
5. අපේක්ෂිත නිෂ්පාදන මට්ටම

(..........)

(27) පහත දැක්වෙන්නේ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යවලට අදාල උපකරණ කිහිපයකි.

A - ඇසුරුම B - වට්ටම් C- ප්‍රචාරණය D - ආවරණය E - ප්‍රවාහනය

F - සන්නම G - ගෙවීම් කොන්දේසි H - ගුණත්වය J - වගකීම්

K - මහජන සම්බන්ධතා L - ඉසව් හා අත්දැකීම් M - නිමාව N - තොග

ඉහත දෑ අතුරින් නිෂ්පාදිතයට පමණක් අදාල උපකරණ ඇතුළත් පිළිතුර වනුයේ,

1. ADF හා N ය. 2. DHI හා J ය. 3. BHHL හා M ය.

4. AFHJ හා M ය. 5. EIKLM හා N ය. (..........)

(28) මූල්‍ය කළමණාකරණ තීරණ හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යාපාර නවීකරණය සඳහා දරන පිරිවැය දිගුකාලීන ආයෝජනයකි.

B - සාංගමික බැඳුම්කර නිකුත් කිරීම කෙටිකාලීන ආයෝජනයකි.

C - ණයගැතියන් හා සම්බන්ධ තීරණ ගැනීම කෙටිකාලීන අයෝජනයකි.

D - ගෙවීම් ප්‍රමාද කිරීම කෙටිකාලීන ආයෝජන තීරණයකි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

1. AB හා C පමණි 2. BC හා D පමණි

3. BD හා C පමණි 4. A හා C පමණි

5. C හා D පමණි (..........)

(29) පහත දැක්වෙන්නේ ව්‍යාපාර මූල්‍ය සම්පාදන මාර්ග පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - බැංකු අයිරා ලබාගැනීම ඍජු මූල්‍ය මාර්ගයකි

B - ණයකර නිකුත් කිරීම අධිතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් සහිත ව්‍යාපාරයකට වාසිදායකය.

C - සාමාන්‍ය කොටස් නිකුත් කිරීම අධික ලාභ ලබන ව්‍යාපාරයකට සුදුසු නැත.

D - අතිරික්ත වත්කම් විකිණීම අභ්‍යන්තර මූල්‍ය මාර්ගයකි.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය හා අසත්‍ය ප්‍රකාශ පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. AB හා CD 2. AD හා BC

3. BC හා AD 4. AC හා BD

5. CD හා AB (..........)

(30) පහත දැක්වෙන්නේ මානව සම්පත් කළමාණාකරණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. මේවා අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. අනුස්ථාපනය යනු සංකල්පීය කුසලතා ලබාදීමයි.
2. සංවර්ධනය යුන සේවක යෝග්‍යතාව අධ්‍යයනය කිරීමයි.
3. රැකියා පිරිවිතරය යනු සේවකයාට වැඩ පරිසරය හඳුන්වාදීමයි.
4. අතිකාල සේවය යනු සේවකයකු වැඩකළ යුතු අනිවාර්ය සේවා කාලයයි.
5. පරිවාස සේවා කාලය යනු සේවකයකු සේවයේ ස්ථිර කිරීමට පෙර සේවා කාලයයි. (..........)

- **අංක 31 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(31) අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ගකිරීමේදී පතල් හා කැනීම් කර්මාන්තය .... අයත්වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේදී පතල් හා කැනීම් කර්මාන්තය .... අයත් වේ.

ආ) ව්‍යාපාරයක සිටින සියලුදෙනා අතර බෙදා හදාගන්නා හා ඊළඟ පරම්පරාවට පවරාදෙනු ලබන ...., ..., ..., ... හා හැසිරීම් රටා සංවිධාන සංස්කෘතිය වේ.

(32) අ) .... මගින් තිරසර ආර්ථික සංවර්ධනයක් ළඟාකර ගැනීමට අපේක්ෂා කරන අතර, වර්තමාන ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම මගින් .... සමාජ තිරසර සංවර්ධනයෙන් අපේක්ෂා කෙරේ.

ආ) අපද්‍රව්‍ය කළමණාකරණයේදී 4R සංකල්පය නියෝජනය කරන්නේ, ..., ..., ..., ... යනුවෙනි.

(33) අ) ආර්ථිකයක් දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ....

ආ) ඇපයෙන් සීමිත සමාගමක්.. සිදු නොකරන අතර ....ද සිදු නොකරයි.

(34) අ) නව රැකියා අවස්ථා → .... → ක්‍රය ශක්තිය ඉහළයාම

↑ නිෂ්පාදනය වැඩිවීම ← .... ↵

ආ) ඒකක භාරයක් ...., ... , ... යනුවෙන් පාර්ශව තුනකින් සමන්විත වේ.

(35) අ) මුහුදු මාර්ග ප්‍රවාහනයේදී නැවට හා නැව්බඩු වලට සිදුවිය හැකි හානි .... හා .... මගින් ආවරණය වේ.

ආ) ආයතනයක් තුළ පවත්නා අභ්‍යන්තර සන්නිවේදනය සඳහා පමණක් ස්ථාපිත තරන දුරකථන පද්ධතිය .... ලෙස හඳුන්වන අතර අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතනය තුළ ඇති දත්තවලට ළඟාවීමට සලසා ඇති ආයතනමය ජාලය .... ලෙස හැඳින්වේ.

(36) අ) පොදු අයිතිය යටතේ පවත්නා මගී බස් ප්‍රවාහන සේවාව පරිපාලනය කරනු ලබන්නේ ....

ආ) පරිගණක තාක්ෂණය මගින් පාලනය කරනු ලබන යාන්ත්‍රික අතක ආකාරයේ උපාංගයකින් ගබඩාවේ ද්‍රව්‍ය ගබඩාකිරීම මෙන්ම ආපසු ලබාගැනීම... මගින් සිදුකෙරේ.

(37) අ) නියමිත කාල සීමාවක් තුළ රටක අපනයන භාණ්ඩවල වටිනාකම හා ආනයන භාණ්ඩවල වටිනාකම අතර වෙනස ....ලෙස හඳුන්වන අතර කිසියම් රටකට වෙනත් රටවලට වඩා අඩු පිරිවැයකින් භාණ්ඩ නිපදවා විකිණිය හැකිනම් එය .... ලෙස හඳුන්වයි.

ආ) යම් කළමණාකරුවෙකුට ඍජුවම වාර්තා කරන සහකරුවන්ගේ සංඛ්‍යාව .... ලෙස හඳුන්වන අතර මෙය බොහෝ දුරට තීරණය වන්නේ, ... අනුවයි.

(38) අ) අලෙවි ප්‍රවර්ධන ක්‍රම කෙරෙහි වැඩි උනන්දුවක් දක්විය යුතු බවට මග පෙන්වන අලෙවිකරණ සංකල්පය .... වන අතර පාරිභෝගික හා සමාජීය යහපැවැත්ම ආරක්ෂා වන

හෝ වැඩි දියුණුවන පරිදි ඉලක්ක වෙළඳපොලේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම ....නම් වේ.

ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිය සන්නම .... පනත යටතේ .... ලියාපදිංචි කළ යුතුය.

(39) අ) නිෂ්පාදනයේ එක් එක් කාර්ය සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු පහසුකම් එකම ස්ථානයක සිදුවන ආකාරයට පිළියෙල කරන පිරියත .... වේ.

ආ) නිෂ්පාදන ආයතනයක හැම නිෂ්පාදනයක්ම දෝෂ වලින් තොරව නිෂ්පාදනය කෙරෙන බව සහතික කිරීම .... ශිල්ප ක්‍රමයයි. අමුද්‍රව්‍ය හා නිමිතොග ශූන්‍ය ලෙස පවත්වා ගනිමින් ගබඩා පිරිවැය අවම කර ගැනීමට යොදාගන්නා ක්‍රමයක් ලෙස .... ක්‍රමය හැඳින්විය හැකිය.

(40) අ) මූල්‍ය කළමණාකරණයේදී .... හා .... යන සංකල්ප එකිනෙකට එරෙහිව ක්‍රියාත්මක වේ.

ආ) සාමූහික කේවල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස .... ඇතිවන අතර එය නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත්වන්නේ, ... අනුමැතිය ලබා ගැසට් නිවේදනය පළ කිරීමෙනි.

- **අංක 41 - 50 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) සමාජ හා සංස්කෘතික පරිසරයේ ප්‍රධාන උපනතීන් 4ක් සඳහන් කරන්න.

1. .... 2. ....
3. .... 4. ....

(42) රජයක් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන ආර්ථික අරමුණු 4ක් නම් කරන්න.

1. .... 2. ....
3. .... 4. ....

(43) හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව ඉදිරිපත් කර ඇති හවුල් ව්‍යාපාරය නිර්වචනයේදී තිබිය යුතු ලක්ෂණ 4ක් ලියන්න.

1. .... 2. ....
3. .... 4. ....

(44) ව්‍යවසායකත්වය තුළින් පිළිඹිබු වන නව ප්‍රවණතා කවරේ ද

1. .... 2. ....
3. .... 4. ....

(45) ව්‍යවහාර මුදල් නොවන විද්‍යුත් ගෙවීම් උපකරණ 4 ක් ලියන්න.

1. .... 2. ....
3. .... 4. ....

(46) වගකීම් රක්‍ෂණ ඔප්පු වර්ග 4ක් නම් කරන්න.

1. .... 2. ....

3. .... 4. ....

(47) සංවිධාන ව්‍යුහයකින් පෙන්නුම් කරන මූලිකාංග 4ක් නම් කරන්න.

1. .... 2. ....

3. .... 4. ....

(48) ශ්‍රම ඵලදායීතාවය වර්ධනය කරගත හැකි ආකාර 4ක් දක්වන්න.

1. .... 2. ....

3. .... 4. ....

(49) අලෙවි මිශ්‍රය ගනුදෙණුකරුගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කිරීමේදී ඊට අදාළ විචල්‍ය 4ක් දක්වන්න.

1. .... 2. ....

3. .... 4. ....

(50) පහත සඳහන් සංකේත වලින් අදහස් වන්නේ කුමක් ද?

1. ....

2. ....

3.  ....

4.  ....

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

32 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

ව්‍යාපාර අධ්‍යයනය - II
Business Studies - II

පැය තුනයි
Three hours

සැලකිය යුතුයි :
- **අවම වශයෙන් (අ) කොටසින් ප්‍රශ්න 2ක් ද, (ආ) කෙටසින් ප්‍රශ්න 2ක් ද වන සේ ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

(අ) කොටස

(01) I. (අ) ලාභය උපරිම කිරීමට අමතරව ව්‍යාපාරයකට තවත් අරමුණු පැවතිය හැකිය. එවැනි අරමුණු 4ක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට ව්‍යාපාර අත්‍යවශ්‍යය. එම ව්‍යාපාර විවිධ නිර්ණායක ඔස්සේ වර්ග කළ හැක. මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 02)

II. (අ) ''ව්‍යාපාර විකාශනයේ ප්‍රබල අවස්ථාවක් වූයේ මුදලේ ක්‍රමික විකාශනයයි.'' ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වනනේ ද? හේතු දක්වන්න. (ලකුණු 02)

(ආ) ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව 4ක් නම් කර එම පාර්ශව ව්‍යාපාරයකට වැදගත්වීමට හේතු දක්වන්න. (ලකුණු 02)

III. ව්‍යාපාර පරිසරය නිවැරදිව අවබෝධ කර ගැනීම වර්තමාන ව්‍යාපාරයකට ඉතා වැදගත් වේ. එසේ වැදගත්වීමට හේතුවන කරුණු මොනවාද? (ලකුණු 04)

IV. අ) ව්‍යාපාර ආයතනයක් ආර්ථික තිරසරබව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමුවිය යුතු කරුණු 4ක් නම් කරන්න. (ලකුණු 02)

ආ) ව්‍යාපාරයකට ආර්ථික තිරසාරබව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 4 ක් ලියන්න. (ලකුණු 02)

V. අ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) ගුණාත්මක ණය සීමා ක්‍රියාත්මක කරන ආකාර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(02) I. (අ) ''පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබාදීමට සලසාදී ඇති නීතිමය ආවරණය වන පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වී ඇත.'' එසේ අවශ්‍යවීමට හේතු මොනවාද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට විවිධ ආකාරයෙන් වැදගත් වේ. එසේ වැදගත්වීමට හේතු 4 ක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

II. කුමාර තම පියාගෙන් උරුම වූ සිල්ලර බඩු වෙළඳසැල තම මිතුරා වූ සනත් සමග එකතුවී සී/ස පෞද්ගලික සමාගමක් බවට පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

(අ) එය ලියාපදිංචි කළයුතු පනත කුමක් ද? (ලකුණු 01)

(ආ) එය පිහිටුවීමෙන් ලැබිය හැකි වාසි තුනක් හා අවාසි තුනක් ලියන්න. (ලකුණු 03)

III. ව්‍යාපාර සාංයෝජනය වීම දෙආකාරයකින් සිදුවේ. එම ආකාර දෙක නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

IV. (අ) පෞද්ගලික ව්‍යවසායකත්වය යටතේ කොතරම් ව්‍යාපාර තිබුනද, රටක රජය මඟින් ද ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යයි. එසේ කිරීමට බලපාන හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ''ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර මනා සම්බන්ධතාවයක් පවතී.'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 02)

V. කුමාර, කොලොස්ටරෝල් රෝගය සඳහා තමන්ගේම වට්ටෝරුවක් අනුව ඖෂධ වර්ගයක් නිපදවා වෙළෙඳපොළට අලෙවි කරයි. අනිල් සිය පියාගෙන් උරුම වූ සිල්ලර වෙළඳසැල ඉහළ ආදායමක් ලබමින් පවත්වාගෙන යයි. අඛිල නුවරඑළියෙන් තොග වශයෙන් ස්වභාවික මල් ලබාගෙන මල් සැකසුම් ව්‍යාපාරවලට සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

අ) මෙම පුද්ගලයින් තිදෙනා අතරින් ව්‍යවසායක ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නා හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 01)

ආ) ව්‍යවසායකයකු තුළ තිබිය යුතු ගතිලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 03)

(03) I. අ) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීම සඳහා ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද පිළිගන්නා විවිධ නිර්ණායක භාවිතා කරයි. එවැනි ගුණාත්මක නිර්ණායක හා ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් ලියන්න. (ලකුණු 02)

II. රැකියා විරහිතව සිටි තරුණයෙකු වූ ප්‍රියංකර ස්වයං රැකියාවක් වශයෙන් කිරිගවයන් විසිදෙනෙකු ඇතිකිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම කාර්යය ඔහු ඉතා වුවමනාවෙන් සිදුකරන නිසා ඔහුට වෙනත් ගවයින් ලබාගෙන මෙය වර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් ඇත. ඔහු ව්‍යවසායකත්ව කුසලතා අති පුද්ගලයකු වුවද ව්‍යාපාර වර්ධනය දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. ස්වයං රැකියාවක් කරන කුඩා ව්‍යාපාරිකයකු වන ප්‍රියංකරට මුහුණදීමට සිදුවන දුෂ්කරතා 4ක් විස්තර කරන්න. (ලකුණු 04)

III. අ) සිරිපාල සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යයි. එහි වෙළඳාමේ කටයුතු හොඳින් කෙරීගෙන ගියද ඔහු තම ව්‍යාපාරයේ මුදල් සැමවිටම ලාච්චුවේ තබාගන්නා අතර බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන නොයයි. ව්‍යවහාර මුදලින් ගනුදෙනු කිරීමට වඩා ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ලැබිය හැකි වාසි 4ක් සිරිපාලට පැහැදිලි කර දෙන්න. (ලකුණු 02)

ආ) විද්‍යුත් බැංකු සේවා 4ක් නම් කරන්න. (ලකුණු 02)

IV. අ) වර්තමානයේ ගෙවීම් පියවීම සඳහා ණයපත් හා හරපත් භාවිතය වැඩිවෙමින් පවතී.

a) ණයපත හා හරපත වෙන වෙනම හඳුන්වන්න. (ලකුණු 01)

b) ඒවායේ භාවිතය වැඩිවීමට හේතු දෙකක් දක්වන්න. (ලකුණු 01)

ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් නම් කරන්න. (ලකුණු 02)

V. පහත සඳහන් ප්‍රකාශ කියවා ඒවාට අදාළ වන රක්ෂණ මූලධර්මය නම්කර එම මූලධර්මය අදාළ වන හේතුව පැහැදිලි කරන්න.

a) රක්ෂණ ඔප්පුව ලබාගන්නා අවස්ථාව වන විට කමනී හෘදයාබාධයකට ප්‍රතිකාර ගනිමින් සිටියද ඒ බව හෙළිදරව් කිරීමක් සිදු නොවීය. රක්ෂණය කර මාස දෙකක් තුළ කමනී මියගිය අතර රක්ෂණ සමාගම වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරයි.

b) සමන්ත සිය පාවහන් කර්මාන්තශාලාව රු. ලක්ෂ 10 බැගින් රක්ෂණ ආයතන තුනක ගිනි රක්ෂණ ඔප්පු ලබා ඇත. ගින්නකින් කර්මාන්ත ශාලාවට ලක්ෂ 10 අලාභයක් වූ අතර රක්ෂණ ආයතන තුනෙන් ලැබුනේ ලක්ෂ 10 වන්දියක් පමණි.

c) අනතුරකින් මුළුමනින්ම හානියට පත් වූ ප්‍රසන්නගේ මෝටර් රථයට වන්දිගෙවීමට පෙර මෝටර් රථයේ සුන්බුන් අගය රක්ෂණ සමාගමට භාරදිය යුතු විය.

d) ගින්න යන උපද්‍රව්‍ය පමණක් ආවරණය වන පරිදි ගිනිරක්ෂණ ඔප්පුවක් ලබාගෙන තිබූ දේවකගේ ව්‍යාපාරයට කෝලාහලයක් හේතුවෙන් විශාල අලාභයක් සිදුවිය. රක්ෂණ සමාගම ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. (ලකුණු 04)

(04) I. (අ) ව්‍යාපාරයකට භාවිතා කළ හැකි අභ්‍යන්තර විද්‍යුත් සන්නිවේදන ක්‍රම 4ක් සහ බාහිර විද්‍යුත් සන්නිවේදන ක්‍රම 4ක් ලියන්න (ලකුණු 02)

(ආ) සන්නිවේදන මාධ්‍යයක් තෝරාගැනීමේ දී සලකා බැලියයුතු කරුණු 4ක් ලියන්න (ලකුණු 02)

II. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව සඳහා මෑතකදී ක්‍රියාත්මක කරනු ලැබූ ක්‍රියාමාර්ග සහ යෝජිත ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 04)

III. (අ) ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළයුතු ආකාර 4ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) වර්තමානයේ සෑම නිෂ්පාදන කර්මාන්තශාලාවකට පාහේ සැපයුම් හා ව්‍යාපාර සේවා අත්‍යවශ්‍ය වී ඇත. එසේ අවශ්‍යවීමට හේතු 2ක් ලියන්න. (ලකුණු 02)

IV. අ) වෙළඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි 2ක් සහ අවාසි 2ක් ලියන්න. (ලකුණු 02)

ආ) කණිෂ්ක විශාල වෙළෙඳසැලක හිමිකරුවෙකි. ඔහු අන්තර්ජාලය හරහා වෙළඳාම් කිරීමට අදහස් කරයි. එහි යෝග්‍ය අයෝග්‍යතාවය ගැන හඳුන්වාදෙමින් විද්‍යුත් වෙළඳාමෙන් ලදහැකි වාසි හා අවාසි කණිෂ්ක හට පැහැදිලි කර දෙන්නේ කෙසේ ද?
(ලකුණු 02)

V. ආ) ආනයන අපනයන වෙළඳාමේදී භාවිතා වන පහත ලියවිලි අතුරින් 2 ක් කෙටියෙන් හඳුන්වන්න.

i. ණයවර ලිපිය

ii. ප්‍රභවස්ථාන සහතිකය

iii. නෞභාරපත (ලකුණු 02)

ආ) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපය

ii. යුරෝපා සංගමය

iii. රටවල් අටේ කණ්ඩායම (ලකුණු 02)

(ආ) කොටස

(05) I. අ) අග්‍ර කළමණාකරණය සඳහා වැදගත් වන්නේ, සංකල්පනාත්මක කුසලතා පමණි. මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) ''ආයතනයක පර්යේෂණ හා සංවර්ධන අංශයෙන් සිදු කරනුයේ නව නිෂ්පාදන බිහිකිරීම පමණි.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 02)

II. මනා ලෙස සැලසුම්කරණය කර සකස් කරන ලද සැලසුමක අඩංගු විය යුතු කරුණු 4ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. (අ) සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමණාකරණය බලපෑම් කරන ආකාර 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ආයතනයකට කළමණාකරණය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

IV. පහත දැක්වෙන්නේ ආයතනයක ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරුය. උපරිම ද්‍රව්‍ය පරිභෝජනය දිනකට ඒකක 90 කි. අවම ද්‍රව්‍ය පරිභෝජනය දිනකට ඒකක 45 කි. යළි ඇණවුම් කිරීමේ කාලය අවම දින 14 හා උපරිම දින 30 හා යළි ඇණවුම් ප්‍රමාණය 3500 කි. එම අයිතමයට අදාළ

(අ) යළි ඇණවුම් මට්ටම කොපමණද? (ලකුණු 02)

(ආ) උපරිම තොග මට්ටම කොපමණද? (ලකුණු 02)

V. අ) ආරක්ෂණ ආන්තිකය යනු කුමක් ද? මෙය ව්‍යාපාරයකට වැදගත්වන්නේ ඇයි ? (ලකුණු 02)

ආ) ව්‍යාපාරයකට නව තාක්ෂණය යොදා ගැනීමෙන් ඉහළ ප්‍රතිලාභ අත් වේ. එසේම එමගින් අත්වන ගැටලුද දැකිය හැකිය. එවැනි ගැටලු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(06) I.



ඉහත දක්වා ඇත්තේ ඔබ පාසලේ 2018 වසරේ අ.පො.ස. උ.පෙළ වාණිජ අංශයේ ප්‍රතිඵල විශ්ලේෂණ ප්‍රස්තාරය යයි උපකල්පනය කරන්න. ඉහත ප්‍රතිඵලය 2019 වසරේදී 25% කින් ඉහළ නැංවීම සඳහා සැලසුමක් සකස් කිරීමේදී පහත සඳහන් සැලසුම්කරණ ක්‍රියාමාර්ග සඳහා ඔබ ලබා දෙන යෝජනා දෙක බැගින් දක්වන්න.

* උපාය මාර්ග හඳුනාගැනීම
* සම්පත් විශ්ලේෂණය
* සැලසුම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
* සාර්ථකත්වය මැන බැලීම (ලකුණු 04)

II. අ) සැලසුම්කරණයේදී පැනනගින ගැටලු හා සීමා 4ක් නම් කරන්න. (ලකුණු 02)

ආ) මධ්‍යගතකරණයේ වාසි මොනවාද? (ලකුණු 02)

III. අලංකාර ඇඳ ඇතිරිලි පින්තාරු කිරීමේ ව්‍යාපාරයක මාසික නිෂ්පාදන කටයුතු සඳහා මිලටගත් රෙදි සඳහා රු. 25,000/= ද, තීන්ත සඳහා රු. 11,000/= ක්ද වැය වේයයි අපේක්ෂා කරයි. ආයතනය මාසිකව නිපදවීමට බලාපොරොත්තු වන ඇඳ ඇතිරිලි සංඛ්‍යාව 250 කි. එක ඒකකයක විකුණුම් මිල රු. 500/= ක් වන අතර ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා මාසිකව රු. 28,000/= ගාස්තුවක් ද ගෙවීමට සිදුවේ. නිපදවන ඇඳ ඇතිරිලි 100 ක් සඳහා සේවකයා වෙනුවෙන් රු. 10,000/= ක් වැය කරයි.

a) ව්‍යාපාරයේ මුළු විචල්‍ය පිරිවැය ගණනය කරන්න.

b) මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

c) අදාල කාලච්ඡේදයේ මුළු පිරිවැය සොයන්න.

d) කාලච්ඡේදයට අදාල ලාභය ගණනය කරන්න. (ලකුණු 04)

The National e-learning portal for The General Education

IV.



අ) T, T1, Q2 සහ Q3 යන අක්ෂරවලින් හැඳින්වෙන දෑ නම් කරන්න. (ලකුණු 02)

ආ) ඵලදායිතාවය මැනීමේ දී පූර්ණ හා ආංශික වශයෙන් ඵලදායිතාවය මැනිය හැකි ආකාර දක්වන්න. (ලකුණු 02)

V. අ) ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා දෙයාකාරයකට වර්ග කළ හැකිය. එම අවශ්‍යතා වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

ආ) අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(07) I. අ) ආර්ථිකයක මූල්‍ය තීරණ ක්‍රියාත්මක කිරීමේ නිරත මූල්‍ය පද්ධතියක සංයුතිය දක්වන්න. (ලකුණු 02)

ආ) රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ආධාරවන මූල්‍ය යටිතල පහසුකම් සඳහා උදාහරණ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. පහත දක්වෙන තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සී/ස අරුණලු සහ සමාගම 2018/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	රු. දහස්	
ස්ථාවර වත්කම්	5,000	
බඩුතොගය	600	
ණයගැති	1,200	
මුදල් ශේෂය	250	
		7,050
සා/කොටස් ප්‍රාග්ධනය	2,200	
13% වරණීය කොටස්	2,600	
සංචිත	600	
16% ණයකර	900	
ණයහිමි	550	
ගෙවිය යුතු වියදම්	200	
		7,050

a) අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග හා බාහිර මූල්‍ය සම්පාදන මාර්ග එක බැගින් දක්වන්න. (ලකුණු 01)

b) මෙම සමාගමේ දළ කාරක ප්‍රාග්ධනය හා ශුද්ධ කාරක ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

c) මෙම සමාගමේ ණය හිමිකාරිත්ව අනුපාතය ගණනය කර දක්වන්න. (ලකුණු 01)

III. අ) පහත ප්‍රවර්ධන උපකරණවලට අයත් ප්‍රවර්ධන ක්‍රමය කුමක් දැයි ලියා දක්වන්න.

a) වගකීම් සහතික පිරිනැමීම b) කැටලොග් c) ප්‍රදර්ශන
d) ඩිජිටල් නාම පුවරු (ලකුණු 02)

ආ) මිහිරානි සිය ව්‍යාපාර කටයුත්ත ලෙස පවත්වාගෙන යනු ලබන්නේ හම්බන්තොට ලුණු ලේවායෙන් තොග වශයෙන් ලබාගත් ලුණු පැකට්කර ටිකිරි ලුණු නමින් වෙළඳපලට නිකුත් කිරීමයි. මිහිරානි තම නිෂ්පාදන සඳහා යොදාගත් සන්නම කවර සන්නමක් ද? (ලකුණු 02)

IV. අලෙවිකරණ සංකල්පය විකුණුම් සංකල්පයෙන් වෙනස්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.(ලකුණු 04)

V. අ) හොඳ සන්නමක තිබිය යුතු ගුණාංග 4ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) ව්‍යාපාරිකයෙකුට ඍජු අලෙවිකරණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න (ලකුණු 02)

(08) I. අ) කොටස් වෙළඳපොලේ ක්‍රියාත්මක වන වොච් ලිස්ට් පුවරුව (Watch list Board) යනු කුමක් ද? (ලකුණු 02)

ආ) S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය සකස් කිරීමේදී විශාලතම හා වඩාත් ද්‍රවශීල සමාගම් 20 තෝරාගැනීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක මොනවාද? (ලකුණු 02)

II. අ) ඇසුරුමක් සැලසුම්කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවා ද? (ලකුණු 02)

ආ) භාණ්ඩ ජීවන චක්‍රය නමැති න්‍යායාත්මක සංකල්පය ගොඩනැගීමේදී යොදාගනු ලබන උපකල්පන මොනවාද? (ලකුණු 02)

III. චන්දිමා දීර්ඝකාලයක් තිස්සේ ඇඟළුම් ආයතනයක් පවත්වාගෙන යයි. මෙම ආයතනයේ සේවක වැටුප් වසර ගණනාවකින් වැඩි කිරීමක් සිදුවී නොමැති අතර උසස්වීම් ලබාදීම සඳහා ද ක්‍රමවත් වැඩ පිළිවෙලක් නොමැත. අවම පහසුකම් යටතේ සේවකයන් සේවයේ යෙදෙන අතර සේවකයන් වැඩට නොපැමිණීම හා සේවයෙන් ඉවත්වීම සුලභ සිද්ධියකි. මෙම ගැටලුකාරී තත්ත්වය නිසා නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට නොහැකිවීමෙන් වෙළඳපල ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වීම නිසා ලැබෙන ඇණවුම් ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

අ) මෙම ආයතනයේ සේවකයන් තෘප්තිමත් නොවන බව පැහැදිලි වේ. එසේ වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

ආ) සේවකයෝ තෘප්තිමත් ව කටයුතු නොකරන්නේ නම් ඔවුන් තෘප්තිමත් කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

IV. ආයතනයක ගිණුම් ලිපිකරු තනතුර සඳහා නියමිත ආකෘතියේ රැකියා විස්තරයක් පිළියෙළ කරන්න. (ලකුණු 04)

V. සී/ස ලෝචන සමාගම A හා B යනුවෙන් නිෂ්පාදන අංශ දෙකකින් සමන්විත වන අතර පිළිවෙළින් සේවකයන් 100 හා 80 දෙනෙක් සේවයේ නිරතවී සිටිති. ලබන වසරේදී අංශ දෙකේම නිෂ්පාදිත ප්‍රමාණය 50% කින් වැඩිකිරීමට බලාපොරොත්තු වන අතර සේවක සංඛ්‍යාවද වැඩිකිරීමට අපේක්ෂිතය. A අංශයේ 6 දෙනෙකු B අංශයට උසස්වීම් ලැබීමටද නියමිතය. එසේම A අංශයේ සේවකයන් තුන්දෙනෙකු හා B අංශයේ සේවකයන් තුන්දෙනෙකු විශ්‍රාම යාමටද අපේක්ෂිතය. 50% සේවකයන් පිටතින් බඳවාගැනීමටද බලාපොරොත්තු වේ.

අ) ඔබ විසින් මානව සම්පත් අවශ්‍යතාව පුරෝකතනය කිරීමේදී සලකාබලන ලද කරුණු ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

ආ) ඔබගේ සිද්ධියට අදාල ආයතනයේ එක් එක් අංශය සඳහා අභ්‍යන්තර හා බාහිර වශයෙන් බඳවාගත යුතු සේවක සංඛ්‍යාව කොපමණවේදැයි ගණනය කරන්න.
(ලකුණු 02)